තානාපතිනි ටෙප්ලිට්ස්, "ඩේලි එෆ්ටී" (Daily FT) පුවත්පත සමග පැවැත්වූ සාකච්ඡාව

නව එක්සත් ජනපද තානාපතිනිය ශ්‍රී ලංකාව ගැන විවෘතව තම අදහස් පළ කරයි.

දෙසැම්බර් 10, 2018

වැඩ භාර ගැනීමෙන් පසු සහභාගි වූ පළමුවැනි සම්මුඛ සාකච්ඡාවේ දී තානාපති ඇලයිනා බී. ටෙප්ලිට්ස්, ඇගේ සැලසුම්, ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජනපද අපේක්ෂාවන් සහ ශ්‍රී ලංකාවේ ඇතැම් ආසන්න හා මධ්‍යම කාලීන අභියෝගයන් සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ අනාගත දැක්ම පිළිබඳ ව අදහස් පළ කළා ය.

එක්සත් ජනපදයේ විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ වෘත්තීය සාමාජිකයෙකු වන ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද නව තානාපතිනිය වන ඇලයිනා බී. ටෙප්ලිට්ස් තම රැකියාව "ඉතා ප්‍රබෝධක සහ අභියෝගාත්මක" කාර්යයක් ලෙස විස්තර කරයි. ඇය ලංකාවට පැමිණියේ රට ප්‍රජාතන්ත්‍රවාදය සහ දේශපාලනය අතින් සන්ධිස්ථානයක සිටින අවස්ථාවක වුවත්, ස්ථාවරත්වය හා සමෘද්ධිය ළඟා කර ගැනීමට ඇති හැකියාව ද ඉහල මට්ටමක පවතින බව ඇගේ අදහසයි. දේශීය මාධ්‍ය සමග පැවැත්වූ පළමු සාකච්ඡාව වන ඩේලි එෆ්ටී (Daily FT) සම්මුඛ සාකච්ඡාවේ දී, ආසියාවේ දීර්ඝ අත්දැකීම් ඇති ටෙප්ලිට්ස්, සිය සැලසුම්, ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජනපද අපේක්ෂාවන් සහ ශ්‍රී ලංකාවේ ඇතැම් ආසන්න හා මධ්‍යම කාලීන අභියෝගයන් පිළිබඳ ව එක්සත් ජනපදයේ අනාගත දැක්ම ගැන ඇගේ අදහස් පළ කළා ය. එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවන්ට 70 වසරක් සපිරෙන මේ අවස්ථාවේ, ද්විපාර්ශ්වික දේශපාලන හා ආර්ථික සහයෝගිතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා බොහෝ ඉඩ ප්‍රස්ථා ඇති බව ඇය තරයේ විශ්වාස කරයි. ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළෙඳපොළ එක්සත් ජනපදය වන අතර විවිධ සමාජ- ආර්ථික සංවර්ධන කාර්යයන් සඳහා ඩොලර් බිලියන 2කට වැඩි ප්‍රමාණයක ආධාර මුදල් ශ්‍රී ලංකාවට ලබා දී තිබේ. මෙම අවංක හා විවෘත සම්මුඛ සාකච්ඡාවේ දී ටෙප්ලිට්ස් පුළුල් සමාජ, දේශපාලන හා ආර්ථික කරුණු රාශියක් පිලිබඳව ඇගේ අදහස් දැක්වූවා ය. පහත දැක්වෙන්නේ මෙම සාකච්ඡාවෙන් උපුටා ගත් කොටස් කීපයකි.

*ප්‍රශ්නය: ඔබ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ලෙස පත් කර ඇති බව දැන ගත් විට, ඔබේ මුල් සිතුවිලි වූයේ මොනවා ද?*

ඕනෑම රටක තානාපතිවරයෙකු ලෙස නම් කිරීමට ලැබීම ගෞරවයක්. නමුත් මම දකුණු ආසියාව හා අග්නිදිග ආසියා කලාපයේ වසර ගණනාවක් ම වෘත්තිය කටයුතුවල නියැළී ඇති නිසා මම මේ පත්වීම ගැන විශේෂයෙන් සතුටු වූ බව කිව යුතුයි. එයට හේතුව මා ලබාගෙන ඇති දැනුම හා අවබෝධය මත ඉදිරි කටයුතු සකස් කරගැනිමට මට අවස්ථාවක් ලැබෙන නිසායි. ශ්‍රී ලංකාවට පැමිණීම නිසා එක්සත් ජනපදයට සහ අපගේ හවුල් කරුවන්ගේ රටවලට ඉතා වැදගත් වන මූලික කරුණු පිළිබඳ ව වැඩ කිරීමට අවස්ථාවක් ලැබෙන බවත් සඳහන් කළ යුතුයි. අපි

විශේෂයෙන්ම අවධානය යොමු කරන්නේ ව්‍යාපාරික සබඳතා, ජනතාවන් අතර මිත්‍ර සබඳතා ආදිය දෙසයි. මේවා මගේ හදවතට සමීප කරුණු වන අතර, මගේ දැනුම හා අත්දැකීම් යොදා ගත හැකි, ශ්‍රී ලංකාව වැනි ස්ථානයක ඒ ගැන කටයුතු කිරීමට ලැබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාවේ තානාපතිවරයා ලෙස සේවය කිරීමට අවස්ථාව ලැබීම ප්‍රබෝධක මෙන් ම අභියෝගාත්මක අත්දැකීමකි. එය ප්‍රබෝධක කාර්යයක් වන්නේ කලාපයේ වඩාත් සංකීර්ණ ආර්ථිකයක් සමග කටයුතු කිරීමට සහ ගැඹුරු සබඳතා ගොඩනගා ගැනීමට අවස්ථාවක් ලැබෙන බැවිනි. අපගේ සබඳතාවේ අනෙකුත් මානයන් දෙස බලන විට ශ්‍රී ලංකාව යනු දකුණු ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රට වේ. දශක ගණනාවක් තිස්සේ පැවති අපේ සබඳතාවල අවධානය යොමු වූයේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීම හා රටවල් දෙකට ම බලපාන පොදු කරුණු පිළිබඳ වයි. එය ශක්තිමත් පදනමක් මත මෙම සබඳතා ගොඩනැඟීමට අවස්ථාවකි. මා මෙහි පැමිණියේ බැරෑරුම් දේශපාලන අර්බුදයක් වර්ධනය වෙමින් පැවති කාලයක (ඔක්තෝබර්) වීම අභියෝගයක් වූ අතර එය තවමත් විසඳී නො තිබීම අතිශයින් ම කණගාටුදායක ය. එය නිසි ආකාරයට විසඳා ගනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. අවසාන තීරණය ගත යුත්තේ ශ්‍රී ලංකාවේ ජනතාව විසින් තෝරා පත් කර ගත් නියෝජිතයින් විසින් බව අපි තරයේ විශ්වාස කරමු. වඩාත් අභියෝගාත්මක වන්නේ මෙම අර්බුදයේ ප්‍රතිවිපාකවලට මුහුණ දෙන ආකාරයයි. ශ්‍රී ලංකාවේ සියලු ම පාර්ශ්වකරුවන් අතර විශ්වාසය පිළිබඳ විසඳා ගත යුතු ගැටලුවක් තිබේ. මෙම අර්බුදය නිසා ආර්ථික වශයෙන් හානිදායක ප්‍රතිඵල ලැබෙනු ඇත. ශ්‍රී ලංකාවේ දේශපාලන හා ප්‍රජාතාන්ත්‍රික ආයතනවලට යම් හානියක් සිදු වී ඇති බව මගේ අදහසයි. ශ්‍රී ලංකාවේ හවුල්කරුවෙකු හා මිතුරකු වශයෙන් අප මෙම කරුණු ගැන සැලකිලිමත් වෙමු.

අපේ රටවල් දෙකට මෙන් ම දෙරටේම ජනතාවන්ට විශාල අවස්ථාවන් විවෘත වන බව කිව යුතුයි. අන්‍යෝන්‍ය ගෞරවය, පොදු සාරධර්ම සහ අපේක්ෂාවන් ඇති විට, මම දකින්නේ හවුල් වීමට හා එක්ව වැඩ කිරීමට බොහෝ ඉඩ ප්‍රස්ථා විවෘත වන බවයි. මගේ විශ්වාසය වන්නේ කිසිදු අවස්ථාවක් සාකච්ඡාවට භාජනය නො කර ඉවත නො දැමිය යුතු බවයි. ඇත්ත වශයෙන් ම අපට තෝරා ගැනීමට බොහෝ දේ ඇති බැවින් අපි ක්‍රියාත්මක කරන දේ ප්‍රමුඛතා පදනමක් මත තෝරා ගැනීම අවශ්‍ය වේ.

*ප්‍රශ්නය: ශ්‍රී ලංකාව හා එක්සත් ජනපදය අතර වසර 70 ක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඔබට සිහි කළ හැකි ද? එහි ප්‍රධාන වැදගත් අවස්ථා මොනවා ද?*

දීර්ඝ කාලයක් තිස්සේ අපේ සබඳතා පැවතී ඇති බව මම අවධාරණය කරමි. නූතන යුගයේ අවුරුදු හැත්තෑවක් යනු ඉතා දිගු කාලයකි. අපේ දෙරට අතර අන්‍යෝන්‍ය සැලකිල්ලට භාජනය වන කරුණු සම්බන්ධව අඛණ්ඩ සබඳතාවක් පවත්වා ගැනීම සැලකිය යුතු කරුණකි. පසුගිය දශක හත තුළ ලෝකය වේගයෙන් වෙනස් වී ඇති අතර ඊළඟ වසර 70 ගැන සිතන විට ද්විපාර්ශ්වික සබඳතා තව තවත් ශක්තිමත්

කර ගැනීමටත්, අන්‍යෝන්‍ය වශයෙන් උනන්දු වන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමටත් අපට හැකි වේ. මේ මගින් අප දෙරටේම ජනතාවට අවශ්‍ය වන සමෘද්ධිමත් හා ස්ථාවර අනාගතයක් ගොඩ නැගීමට හැකි වනු ඇත. ව්‍යාපාරික අවස්ථා, මුහුදු මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කර ගැනීම මෙන් ම වෙනත් අංශ ගණනාවක් තුළ ශක්තිමත් ම සම්බන්ධතා ඇති කර ගැනීම ආදිය සම්බන්ධයෙන් අපේ සැලකිල්ල යොමු විය යුතුයි. නිදසුනක් වශයෙන්, ලෝක මට්ටමේ අධ්‍යාපනයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන් වැඩි සංඛ්‍යාවක් ඇමරිකා එක්සත් ජනපදයේ ඉගනුම ලබනු දැකීමට මම කැමති වෙමි. වර්තමානයේ ශ්‍රී ලාංකික සිසුන් 3,309 ක් එක්සත් ජනපදය පුරා විවිධ විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබති. එක්සත් ජනපදයේ උපාධි පාඨමාලා හදාරන ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව 2017 දී 7% කින් වැඩි වී ඇත. එය වර්ධනය කළ හැකි සංඛ්‍යාවක් බව මට සහතිකය. මෙය රටවල් දෙකට ම වැදගත් වන අතර විශේෂයෙන්ම මෙම සිසුන්ට ආපසු ශ්‍රී ලංකාවට පැමිණ විශාල දායකත්වයක් ලබා දිය හැකි වේ.

අනාගතය ඉඩ ප්‍රස්ථාවන්ගෙන් පිරී ඇති අතර ප්‍රශ්නය වන්නේ අපේ හැකියාවන් පසක් කර ගැනීම සඳහා අපි එකට වැඩ කළ යුත්තේ කෙසේ ද යන්න යි. එනම්, ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපද සබඳතා පූර්ණ ලෙස මල්පල ගැන්වීම වළක්වන ඇතැම් බාධක වලට විසඳුම් ලබා දීමයි. ඒවා ආර්ථික, සමාජීය හෝ පාලන ගැටලු විය හැක. දිගු කලක් තිස්සේ පවතින මිත්‍රත්වය ගැන මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර, මෙම බාධක ජය ගැනීම සඳහා මාර්ග සොයා ගැනීමට අපට එකට එක්ව කටයුතු කළ හැකියි.

*ප්‍රශ්නය: ඔබට, ප්‍රධාන ජයග්‍රහණ ඉස්මතු කර දැක්විය හැකි ද?*

එක්සත් ජනපද-ශ්‍රී ලංකා සබඳතා ඉතා ඵලදායී ප්‍රතිඵල ලබා දුන් අවස්ථා ගණනාවක් තිබේ. එක් කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ දිගු කාලීන සංවර්ධන හවුල්කරුවෙක් ලෙස එක්සත් ජනපදය කටයුතු කර තිබීමයි. අප එක්ව ලබා ගත් ජයග්‍රහණ තුළින් ආර්ථිකයේ තිරසාර පැවැත්මට දායක වී ඇති අතර ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ අනාගතය තම අතට ගැනීමටත්, ඒ මගින් රට දියුණු කිරීමටත් හැකි වී තිබේ. උදාහරණයක් වශයෙන්, ජාත්‍යන්තර වෙළඳපළ තුළ තම අපනයන අලෙවි කිරීම සඳහා කුළුබඩු හා සමාන නිෂ්පාදන සංගමය (Spice and Allied Products Association) පිහිටුවීමට සහාය ලබා දෙන ලදී. එය එතරම් විශේෂ දෙයක් ලෙස නො පෙනුනත් ඒ නිසා ශ්‍රී ලංකාවට වඩාත් ගෝලීය මට්ටමින් තේ සහ කුළුබඩු විකිණීමට හැකි වී තිබේ. මම හිතන විදියට අපි එකිනෙකාට උදව් කරන මේ ආකාරයේ කටයුතුවලින් වර්ධනය ඝාතීය ලෙස ඉදිරියට ගෙන යෑමට හැකි වනු ඇත. එය එක් වරක් පමණක් සිදු වන දෙයක් නොව කාලයක් තිස්සේ ප්‍රතිලාභ අත් කර දෙන කටයුත්තකි.

මගේ අදහස අපේ ද්විපාර්ශ්වික සබඳතාවේ විශේෂ ලක්ෂණය එය බවයි. මෙහි ඇති සෞඛ්‍ය අභියෝගයන්ට මුහුණ දීම සඳහා අපි ඉතා අර්ථාන්විත ලෙස සහාය ලබා දුන්නෙමු. වඩාත් මෑතක දී එය ඩෙංගු සඳහා පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන්

විය. අපි අතීතයේ දී මෙන් දිගටම මාධ්‍ය ඇතුළු සිවිල් සමාජය ශක්තිමත් කිරීමට කටයුතු කරමු. මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීම හෝ ජනතාව වෙනුවෙන් රජයේ හෘද සාක්ෂිය පරීක්ෂාවට ලක් කිරීම ආදි කටයුතු මෙයට ඇතුළත් වේ.

අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) වැනි අපේ ආයතන මගින් සංවර්ධනය, කෘෂිකර්ම සහ කිරි කර්මාන්තය, තිරසාර ජීවනෝපාය, යහපාලනය, සිවිල් සමාජය ශක්තිමත් කිරීම, පරිසර සංරක්ෂණය වැනි විවිධ කටයුතුවලට ආධාර ලබා දී තිබේ.

නිදහස ලැබීමෙන් පසුව, එක්සත් ජනපදයෙන් ලබා දුන් සමස්ත ආධාර ප්‍රමාණය ඩොලර් බිලියන 2 කට වඩා වැඩි වේ.

එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර ප්‍රථම ආර්ථික සහයෝගිතා ගිවිසුම අත්සන් කරන ලද්දේ 1956 අප්‍රේල් මාසයේ දී ය. එතැන් සිට, එක්සත් ජනපදය, සුනාමි සහනාධාර සඳහා ඩොලර් මිලියන 134 ක්, ශ්‍රී ලාංකිකයින් මිලියන 4.3කට ආහාර ආධාර හා මැලේරියාව තුරන් කිරීම සඳහා සහාය වීම ආදි වශයෙන් විවිධ අංශවලට නො මසුරු සහයෝගය ලබා දී තිබේ.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය හරහා ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳ ව අපි අවධානය යොමු කර ඇත්තෙමු. රුපියල් බිලියන 1.2ක් (ඩොලර් මිලියන 7.4) වූ මෙම (MCC) ආයතනයේ මුල් දීමනාව ඉහළ ගුණාත්මක බවකින් යුත්, සාක්ෂි මත පදනම් වූ තිරසාර වැඩපිළිවෙළක් සකස් කිරීමට අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන සඳහා 2016 ජූලි මාසයේ දී ලබා දුන් අතර සංයුක්ත සංවර්ධන කටයුතු අවසන් කිරීම සඳහා අතිරේක රුපියල් මිලියන 413 (ඩොලර් මිලියන 2.6) ලබා දීම සඳහා වූ ගිවිසුම 2017 දි අත්සන් කරන ලදී.

අපගේ සියලු ආධාර ප්‍රදානයන් වන අතර ඒවා ආපසු ගෙවිය යුතු ණය නොවේ. අපි මෙසේ කරන්නේ අප අන්‍යෝන්‍ය අවශ්‍යතාවන් ඇති මිතුරන් සහ හවුල්කරුවන් වන බැවිනි. අවාසනාවකට මෙන්, දේශපාලන අර්බුදය විසඳෙන තෙක් මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනයේ ආධාර ලබා දීම තාවකාලිකව අත් හිටුවා ඇත.

පාරදෘශ්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මෙම අර්බුදය ඉක්මනින් විසඳා ගන්නා ලෙස මිතුරෙකු හා හවුල්කරුවෙකු වශයෙන්, අපි ශ්‍රී ලංකාවෙන් සහ රටේ නායකයන්ගෙන් ඉල්ලා සිටිමු. මෙම දේශපාලන අස්ථාවර බව ආයෝජකයින්ට අවදානම පිළිබඳ පණිවුඩයක් දෙන බැවින්, මෙය ඉතා තීරණාත්මක වේ. එවැනි පණිවුඩ නිකුත් වීම අවසන් කිරීම සහ දේශපාලන ස්ථාවරත්වය යළි තහවුරු කිරීම ඉතා වැදගත් වේ. අර්බුදය විසඳීමෙන් පසුව ආයෝජකයින් අතර ශ්‍රී ලංකාව ගැන විශ්වාසය යළි තහවුරු කිරීම සඳහා යම් කිසි කාල සීමාවක් අවශ්‍ය වන බව මතක තබා ගත යුතු

ය. අපි ශ්‍රී ලංකාවේ ජනතාව සමග සිටින අතර, රජය සහ දේශපාලන නායකත්වයට එය ඉක්මනින් විසඳා ගත හැකි වනු ඇතැයි සිතමු.

*ප්‍රශ්නය: ශ්‍රී ලංකාවේ ඔබේ සේවා කාලය තුළ ඔබට ඇති සැලසුම් මොනවා ද?*

වර්තමාන දේශපාලන අර්බුදයට වඩා, අපගේ පරිකල්පනයට හා අවධානයට යොමු විය යුතු වෙනත් කරුණු කිහිපයක් තිබේ. ඒවා අතර අපේ ව්‍යාපාරික සබඳතා ශක්තිමත් කිරීම, එක්සත් ජනපද ආයෝජන සඳහා අවස්ථා සොයා බැලීම සහ පුළුල් ලෙස වෙළඳාම ශක්තිමත් කිරීම ආදිය වේ. එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළෙඳපොළ වන අතර, රටේ සංවර්ධනයට දායකත්වයක් ලබා දෙමින් ශ්‍රී ලංකාව තුළ එක්සත් ජනපද නිෂ්පාදන ආනයනය, ආයෝජන හා ව්‍යාපාර කටයුතු ආදිය දියුණු වනු දැකීමට මම කැමැත්තෙමි. සමුද්‍රීය කටයුතු ඇතුළුව අපගේ අන්‍යෝන්‍ය ආරක්ෂක අභියෝගයන්හි ප්‍රගතියක් දැකීමට ද මා කැමති වෙමි. නිදහසේ ගමනාගමනය සහ වෙළඳාම් කටයුතු කළ හැකි පරිදි නීතියේ ආධිපත්‍යය තහවුරු කරමින් ජාතීන්ගේ ස්වාධිපත්‍යය සහ නිදහස් හා විවෘත ඉන්දු-පැසිෆික් සාගර කලාපයක් පිළිබඳ පොදු ආස්ථානයක් අපට තිබේ. පශ්චාත් ගැටුම් ප්‍රතිසන්ධාන සහ වගවීමේ ගැටලු විසඳීමට ශ්‍රී ලංකාව කටයුතු කරන අතර, අපගේ හමුදා සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කළ හැකිය. අපට දියුණු කළ හැකි වෙනත් අංශ වන්නේ ජනතාව අතර පුද්ගල සම්බන්ධතා, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ගොඩනැඟීම, උගත් පාඩම් බෙදා ගැනීම, අන්‍යෝන්‍ය සැලකිල්ලට භාජනය වන පොදු ප්‍රතිපත්ති ගැටලු මෙන් ම ආර්ථික අවකාශයේ යහපාලනය, ප්‍රතිසංස්කරණ හා විනිවිදභාවය, දූෂණයට එරෙහිව සටන් කිරීම සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමයි.

ව්‍යාපාර වගකීමෙන් තම කටයුතු කළ යුතු අතර ව්‍යාපාරික ගනුදෙනු සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතු බවට සිවිල් සමාජය පරීක්ෂාවෙන් පසු වන බැවින් විනිවිදභාවය ඉතා වැදගත් වේ. වංචා දූෂණවලට එරෙහිව ගෝලීය ක්‍රියාමාර්ගවලට ව්‍යාපාර අනුගත වුවහොත් ව්‍යාපාරික ගනුදෙනුවලින් දූෂණයේ සැඟවුණු බදු අතුරුදහන් වන බැවින් සියල්ලන්ට ම එයින් ප්‍රතිලාභ අත් වනු ඇත. වෙනත් රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද දූෂණය නිසා ආර්ථිකයට දරා ගැනීමට සිදු වී ඇති ආවස්ථික වියදම අති විශාල ය.

*ප්‍රශ්නය: අතීතයේ දී වඩා පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීම අතින් එක්සත් ජනපදය හා එහි රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ශ්‍රී ලංකාව තුළ සාර්ථක වී තිබේ ද?*

මගේ ආසන්න ම පූර්වගාමියා වූ අතුල් කෙෂාප් සහ මීට පෙර මෙහි සේවය කළ තානාපතිවරුන් සමඟ සාකච්ඡා කිරීමට මට හැකි වූ අතර, ඔවුන්ගෙන් ලැබුණු ප්‍රඥාව හා අවබෝධය ගැන මම ඔවුන්ට කෘතඥ වෙමි. අපේ දිගු ඉතිහාසයක් ඇති ද්විපාර්ශ්වික සබඳතා සහ මෙම අත්දැකීම නිසා, අපට මිතුරෙක් සහ හවුල්කරුවෙක් ලෙස, ශ්‍රී ලංකා රජය, දේශපාලන නායකයින් සහ ශ්‍රී ලාංකික ජනතාව සමග විවෘතව සහ අවංකව කතා කිරීමට හැකියාවක් තිබේ. මෙය අපේ ද්විපාර්ශ්වික සබඳතාවේ

ප්‍රබල හා වැදගත් ලක්ෂණයකි. මෙම සම්ප්‍රදාය දිගටම පවත්වා ගෙන යන ලෙස මගේ පූර්වගාමීන් ඉල්ලා සිටීම පුදුමයට කරුණක් නොවේ. අද වැනි දුෂ්කර දේශපාලන අවස්ථාවන්හිදී, මෙය වඩාත් වැදගත් වන අතර අපට දිගු ඉතිහාසයක් සහිත මිත්‍රත්වයක් ඇති බව ජනතාව තේරුම් ගෙන සිටීම ද වැදගත් වේ. ඔවුන්ගේ අනිත් උපදෙස වූයේ රට පුරා සංචාරය කිරීම, සියලු දෙනා සමඟ සම්බන්ධ වීම සහ විවිධ ගැටලු ගැන ඒ හා සම්බන්ධ අයගෙන් කෙළින්ම විමසා සිටීමයි. ශ්‍රේෂ්ඨ රටක් වන ශ්‍රී ලංකාවේ සියලු ජනතාව සමග අපේ තානාපතිවරුන් විවිධ අත්දැකීම් ලබා තිබේ.

වගකිව යුතු ආයෝජනයන් ඉදිරියට සිදු වන බවත්, ඒ මගින් තිරසාර ආර්ථික ප්‍රතිඵල ලැබෙන බවත්, ඒවායින් නියම ඉපයුම් අනුපාතිකයක් ලැබෙන බවත්, රටේ ආර්ථික අනාගතය පිළිබඳ විකල්ප තෝරා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇති බවත් දැක ගැනීමට අපට අවශ්‍ය වේ. වර්තමාන දේශපාලන අර්බුදය විශේෂයෙන්ම දීර්ඝ කාලයක් පැවතුණ හොත් එහි ඉතා ම හානිකර ප්‍රතිවිපාකයක් වන්නේ, ශ්‍රී ලංකාවට ණය ගෙවීම සඳහා අරමුදල් ලබා ගැනීමේ සිට, අවදානම් සහගත පරිසරයකට පැමිණීමට ආයෝජකයන් මැලි වීම හා ශ්‍රී ලංකාවේ බොහෝ මිතුරන් සමඟ හවුල්කාරීත්ව අවස්ථා බිහි වීම දක්වා වූ සියලු කටයුතු තව තවත් පටු වීමයි.

*ප්‍රශ්නය: එක්සත් ජනපද රාජ්‍යතාන්ත්‍රික කටයුතු ශ්‍රී ලංකාව තුළ ඉටු කළ හැකි බව ඔබ දැඩි ලෙස විශ්වාස කරන කෙනෙක් ද?*

නියත වශයෙන් ම මගේ විශ්වාසය එයයි. එක්සත් ජනපද-ශ්‍රී ලංකා සබඳතා වසර 70 කට පෙර ආරම්භ වූ අතර, අපි දැන් අවධානය යොමු කරන්නේ ඉදිරි වසර 70 ක කාලය දෙසටයි. එය දිගු ගමනකි. ඔබ දන්න පරිදි, අපි ඩොලර් මිලියන 281 ක ආයෝජනයක් සහිත ව නව තානාපති කාර්යාලයක් ඉදි කරමින් සිටිමු. මේවා නො සැලකිලිමත් ලෙස සිදු කර ඇති ආයෝජනයන් නොව, මගේ රජය එහි අගය වටහා ගෙන කරන ලද ආයෝජනයක් වන අතර එය අප අතර ඇති ප්‍රබල බැඳීම හා අනාගත විභවතාවන් නිරූපණය කිරීමකි.

සති කීපයකට පෙර ජනාධිපති සිරිසේනට අක්තපත්‍ර භාර දීමෙන් පසු මම සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයින් හමුවූ නමුත් රනිල් වික්‍රමසිංහ හෝ මහින්ද රාජපක්ෂ තවම නිල වශයෙන් හමුවී නැත. රැස්වීම්වල දී ඔවුන්ගේ අදහස්වලට සවන් දෙමින් අපි අවංක ලෙස අදහස් හුවමාරු කර ගත්තෙමු.

ව්‍යවස්ථාවේ රාමුව තුළ මේ රටේ ජනතාව තෝරා පත් කර ගත් නියෝජිතයින්ට මෙය විසඳීමට ඉඩ දෙන මෙන් අපි ඉල්ලා සිටිමු. ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන නඩුවල ප්‍රතිඵල ගැන පූර්ව විනිශ්චයන් නො කරන අතර, නීත්‍යානුකූල, විනිවිද පෙනෙන හා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් තුළින් බිහි වෙන ඕනෑම ආණ්ඩුවක් සමඟ කටයුතු කිරීමට අපි සූදානම් ව සිටිමු. මෙම දේශපාලන තරගයේ අපට ප්‍රියතමයන් නැත. පුළුල් ලෙස කිව හොත් අපේ මිත්‍රත්වය ඇත්තේ නීත්‍යානුකූල රජය සමග මෙන්

ම ජනතාව සමගයි. ප්‍රජාතාන්ත්‍රික ආයතන ශක්තිමත් කිරීම ඇතුළු අප සැලකිල්ලක් දක්වන ක්ෂේත්‍රවල ඉදිරියට යෑමට අපට හැකි වනු ඇත.

වැදගත් මුහුදු මාර්ග මැද ඇති ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම බොහෝ රටවල ඊර්ෂ්‍යාවට පවා හේතු විය හැකියි. මෙම කලාපය තුළත් එයින් ඔබ්බටත් මෙම මුහුදු මාර්ග හා ගුවන් මාර්ග විවෘතව පවතින බව සහතික කරන අපේ අවශ්‍යතාවන් බෙදා හදා ගන්නා හවුල්කරුවෙක් ලෙස එක්සත් ජනපදය ශ්‍රී ලංකාව පිළිගනී. එහෙයින් නිදහස් ගමන් මාර්ග අවශ්‍ය වෙනත් ජාතීන්ට මෙන් අපට ද මේ පිළිබඳ අන්‍යෝන්‍ය උනන්දුවක් තිබේ. වඩාත් පුළුල් ලෙස කිව හොත් චීනය හා ඉන්දියාව සමග එක්සත් ජනපදයට ශක්තිමත් සබඳතාවන් තිබේ. අප සැම විටම එකඟ නොවන නමුත්, කලාපීය වශයෙන් වැදගත් අවස්ථා බොහෝමයක අප එක්ව කටයුතු කරන අතර ශ්‍රී ලංකාවට ද තම ප්‍රධාන හවුල්කරුවන් සමග සම්බන්ධතා පවත්වා ගෙන යෑමට හැකි වනු ඇතැයි මම අපේක්ෂා කරමි.

*ප්‍රශ්නය: නැඟී එන ආර්ථිකයක් වන ශ්‍රී ලංකාව මුහුණ දෙන ආසන්න සහ මධ්‍යම කාලීන අභියෝගය මොනවා ද?*

මම ඔබේ ප්‍රශ්නය මදක් වෙනස් කරන්නම්. එය අභියෝගයන් ගැන නොව අවස්ථා පිළිබඳවයි. දකුණු ආසියාවේ අන්තර් කලාපීය වෙළඳාම, ලෝකයේ අවම අගයක් දක්වන අතර ආසියාන් (ASEAN) රටවලට සාපේක්ෂව ද අඩු අගයක් දක්වන බැවින් එය පුළුල් කිරීමේ හැකියාවක් තිබේ. එක්සත් ජනපදය හා ඉන් ඔබ්බට ඇති ව්‍යාපාරික සබඳතා පුළුල් කිරීමට ද ඉඩ ප්‍රස්ථා තිබේ. මෙය ශ්‍රී ලංකාවේ ජනතාවට විශාල වශයෙන් ප්‍රතිලාභ අත් කර දෙනු ඇත. මේ තුළින් මම දකින ප්‍රධානතම වාසිය වන්නේ ජනතාවට සෞභාග්‍යය උදා වීමයි. සංඛ්‍යා වලින් පෙන්නුම් කරන පරිදි, මෙම කටයුතු වැඩි දියුණු කර ගැනීමට බොහෝ ඉඩකඩ තිබේ. එය ළඟා කර ගැනීම සඳහා විශාල කැපවීමක් සහ පෙලඹීමක් අවශ්‍ය වේ. ගෝලීය ආයෝජන සඳහා ශ්‍රී ලංකාව අනෙකුත් නැඟී එන හා මැදි ආදායම් රටවල් සමඟ තරඟ කරන බැවින්, ආයෝජන පරිසරය පහසුවෙන් කටයුතු කළ හැකි මෙන් ම ආකර්ෂණීය විය යුතු ය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව හොඳ ම ඉදිරි පියවරක් ගත යුතුයි. එක්සත් ජනපද ආයෝජකයින් ද මෙහි ව්‍යාපාරික කටයුතු කිරීමේ පහසුව සැලකිල්ලට ගනු ඇත. දූෂණය අභියෝගයක් වන අතර, විනිවිදභාවය වැඩි වූ තරමට තත්වය වඩාත් සතුටුදායක වේ. එබැවින් කාර්යක්ෂමතාව සමග එක් වූ විනිවිදභාවය ප්‍රගතිය සඳහා අවස්ථා උදා කරයි. සංචාරක කර්මාන්තය, ඇඟලුම්, කෘෂිකර්මාන්තය, මැණික් ආදිය කෙරෙහි පමණක් අවධානය යොමු කර ඇති ශ්‍රී ලංකාවේ ආර්ථිකය, තාක්ෂණික අංශය වැනි විවිධ ක්ෂේත්‍රවල ඇති සහයෝගිතා අවස්ථා ගැන ද අවධානය යොමු කළ යුතු වේ. දැනුම හා අධ්‍යාපනය ඇතුළු ජනතාවන් අතර සම්බන්ධතා ද දියුණු කළ හැකි තවත් අංශයක් වන අතර එය රටවල් දෙකට ම ප්‍රයෝජනවත් වනු ඇත. ඒ නිසා අනාගතය ඉඩ ප්‍රස්ථාවන්ගෙන් පිරී ඇති අතර, ප්‍රශ්නය වන්නේ එම හැකියාවන් මල්පල ගැන්වීම සඳහා එකට එක්ව කටයුතු කළ හැකි ආකාරයයි. එයින් අදහස්

කෙරෙන්නේ එක්සත් ජනපද-ශ්‍රී ලංකා සබඳතාවල පූර්ණ ශක්‍යතාව කරා ළඟා වීම වළක්වන ඇතැම් බාධක වලට විසඳුම් සොයා ගැනීමයි. ඒවා ආර්ථික, සමාජීය හෝ පාලන ගැටලු විය හැකි ය. දිගු කලක් තිස්සේ පවතින මිත්‍රත්වය වැදගත් වන්නේ මෙහි දී බව මා දැඩි ලෙස විශ්වාස කරන අතර, හවුල්කාරීත්වය තුළින් එම බාධක ජය ගැනීමට මාර්ග සොයා ගත හැකියයි මම විශ්වාස කරමි.

සාධාරණ හා අන්‍යොන්‍ය වෙළඳාම පිළිබඳ ව ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ අවධානය යොමු වී ඇත. ද්වි-පාර්ශ්වික වෙළඳ කටයුතු වල වැදගත්කමත්, එම සබඳතාවන්හි අන්‍යොන්‍ය ප්‍රතිලාභ ඇති බව සහතික කිරීමත් සඳහා ඔහු පෙනී සිටී. එය කුමන රටක් විසින් වත් සලකා බැලීමට නුසුදුසු උපදෙසක් ලෙස මා සිතන්නේ නැහැ.

*ප්‍රශ්නය: එක්සත් ජනපදය මත යැපීම අඩු කර ගැනීමේ මාර්ගයක් ලෙස මෑත වසරවල දී ශ්‍රී ලංකාව, තම අපනයන වෙළඳපොළවල් හා ආයෝජන ලබාගැනීම් විශේෂයෙන්ම නැගෙනහිරට විවිධාංගීකරණය කර තිබේ. ශ්‍රී ලංකාව වඩාත් ආකර්ෂණීය කළ හැකි ආකාරය පිළිබඳ ව ඔබේ අදහස් මොනවා ද?*

කෙටි කාලීන ව, දේශපාලන අර්බුදය විසඳා ගත යුතුයි. වහාම ක්‍රියාත්මක වන පරිදි, එය විනිවිද පෙනෙන හා ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයකින් විසඳා ගන්නා ලෙස මිතුරෙකු හා හවුල්කරුකරුවෙකු වශයෙන් අපි ශ්‍රී ලංකාවෙන් සහ රටේ නායකයන්ගෙන් ඉල්ලා සිටිමු. මෙම දේශපාලන අස්ථාවරත්වය ආයෝජකයින්ට අවදානම පිළිබඳ පණිවුඩයක් දෙන බැවින්, මෙය ඉතා තීරණාත්මක ය. එම පණිවුඩ නිකුත් වීම අවසන් කිරීම සහ දේශපාලන ස්ථාවරත්වය යළි තහවුරු කිරීම තීරණාත්මක වේ. මෙම අර්බුදය විසඳා ගැනීමෙන් පසුව ආයෝජකයින් තුළ ශ්‍රී ලංකාව පිළිබඳ ව විශ්වාසය යළි ස්ථාපිත කිරීම සඳහා යම් කිසි කාල සීමාවක් අවශ්‍ය වන බව මතක තබා ගැනීම වැදගත් වේ. අපි ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ සිටින අතර, රජය සහ දේශපාලන නායකත්වය අර්බුදය ඉක්මනින් විසඳා ගනු ඇතැයි අපේක්ෂා කරමු. මේ සටනේ දී අපි පැත්තක් ගන්නේ නැත. අපේ අපේක්ෂාව වන්නේ ව්‍යවස්ථාදායක ක්‍රියාදාමයට හා විනිවිදභාවයට ගරු කරන, නීත්‍යනුකූල රජයක් බිහි වීමයි. දීර්ඝ කාලීන වශයෙන් බලන විට, හොඳ ආයෝජන පරිසරයක් ඇති කළ හැකි රාජ්‍ය ප්‍රතිපත්ති සහයෝගීතාවයක් අපි අපේක්ෂා කරමු. මේ සම්බන්ධයෙන් අපි ශ්‍රී ලංකාවේ ඇමරිකානු වාණිජ මණ්ඩලය සමඟ සමීපව කටයුතු කරමින්, ආයෝජන සඳහා පහසුකම් සපයන නීති, රෙගුලාසි, භාවිතයන් සහ ක්‍රියා පටිපාටි වෙනස් කිරීම පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරමු. වාර්ෂිකව, මගේ රජය විසින් බොහෝ පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන තොරතුරු භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ විනිවිදභාවය හා වාණිජමය අවස්ථා පිළිබඳ වාර්තාවක් සකස් කරයි. මෙම වාර්තාව හා ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (World Banka/IFC) ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය, ආයෝජන පරිසරය වඩා යහපත් බවට පත් කිරීම සඳහා හොඳ මාර්ග සිතියමක් වේ. ජීවනෝපාය අවස්ථා වැඩිදියුණු කළ හැකි බිම්

මට්ටමේ ක්‍රියාකාරකම් පිළිබඳ ව ද අපි අවධානය යොමු කරමු. තානාපති කාර්යාලයේ මහජන කටයුතු පිළිබඳ කණ්ඩායම, තරුණයන්ගේ නිර්මාණශීලීත්වය වෙළඳපොළට ගෙන ඒමට ව්‍යවසායකත්වය පිළිබඳ ව කටයුතු කරමින් තරුණයන්ට උපකාර කරන අතර එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කිරි කර්මාන්තයේ තිරසාර බව සහතික කිරීමට කටයුතු කරමින් සිටී.

*ප්‍රශ්නය: ආසන්න සහ මධ්‍යම කාලීන සන්දර්භය තුළ එක්සත් ජනපදය විසින් අනුබල දෙන ලද වටිනාකම් සාක්ෂාත් කර ගැනීමේ දී පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය ඉටු කරන කාර්යභාරය කුමක් ද?*

ආසන්න වශයෙන් බලන විට රටේ අනාගතය සඳහා යහපත් දේ පැහැදිලි කර ගැනීම වැදගත් වේ. මෙම අර්බුදය ව්‍යාපාර, ආර්ථිකය හා අනාගත ආයෝජන අවස්ථා ආදියට හානි කර බැවින් "කරුණාකර දේශපාලන අර්බුදය විසඳන්න" යනුවෙන් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය ඇතුළු කර්මාන්ත කණ්ඩායම් ගණනාවක් ම ඉල්ලීම් කර ඇති බව මා දැක තිබේ. ව්‍යාපාරික ප්‍රජාව සහ සිවිල් සමාජය ඉදිරියට යෑම පිළිබඳ ව ඔවුන් දකින දෙය ඉතා පැහැදිලිව හා උස් හඬින් ප්‍රකාශ කර තිබේ. මෙම අර්බුදය දේශපාලන ක්ෂේත්‍රයෙන් ඔබ්බට බලපා ඇති බව දේශපාලන නායකයින් විසින් වටහා ගත යුතු වේ. කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැළී අය හොඳින් දන්නා පරිදි දිගු කාලීන වශයෙන් බලන විට ව්‍යාපාරික සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ඇති බාධක ඉවත් කිරීම වැදගත් ය. ඒ සමගම, වගකිව යුතු ව්‍යාපාර සහ සිවිල් සමාජය ඔවුන්ගේ ව්‍යාපාරික ගනුදෙනු සම්බන්ධයෙන් වගකිව යුතු බැවින්, විනිවිදභාවය ඉතා ම වැදගත් වේ. මූල්‍ය ක්‍රියා කාර්යසාධන බලකාය (Financial Action Task Force) විසින් ශ්‍රී ලංකාව අළු-ලැයිස්තුවට (Grey-List) දමා ඇති බැවින්, ගෝලීය අවශ්‍යතා සපුරා ලන ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික වීම අවශ්‍ය වේ. රට, අළු ලැයිස්තුවෙන් ඉවත් කර ගැනීමට අවශ්‍ය අලුත් නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට ව්‍යාපාරික ප්‍රජාව ද ඉදිරියට පැමිණ රජය සමග එක්ව කටයුතු කළ යුතු ය. මෙය රජයේ උත්සාහයක් නොවේ. එය ආර්ථිකයට හා ව්‍යාපාරික ප්‍රජාවට ප්‍රතිලාභ ගෙන දෙන කාර්යයකි. මෙය විනිවිදභාවයේ වැදගත්කම තවත් ශක්තිමත් කරයි. වංචා දූෂණවලට එරෙහිව ගෝලීය ක්‍රියාමාර්ගවලට, ව්‍යාපාරික ප්‍රජාව ද සහයෝගය දැක්වුව හොත් සියල්ලන්ට ම එහි ප්‍රතිලාභ ලැබෙනු ඇත. මෙයට හේතුව වන්නේ ව්‍යාපාරික ගනුදෙනුවලින් දූෂණයේ සැඟවුණු බදු අතුරුදහන් වීමයි. වෙනත් රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද ආර්ථිකයට මේ නිසා දැරීමට සිදු වන ආවස්ථික වියදම අති විශාල ය.

*ප්‍රශ්නය: පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය විසින් ප්‍රකාශ කරන ලද අදහස් හා ඔවුන්ගේ මෙම කටයුතුවලට සම්බන්ධ වීමේ මට්ටම හෝ දේශපාලන අර්බුදය සම්බන්ධයෙන් ඔවුන්ගේ විරෝධය පිළිබඳ ව ඔබ සෑහීමකට පත්වන්නේද?*

කර්මාන්ත වාණිජ මණ්ඩල අදහස් පළ කර ඇති අතර, ආණ්ඩුවේ ඇතුළේ සහ ඉන් පිටත සිටින, දේශපාලන නායකත්වයට ඒ මගින් වැදගත් ප්‍රතිචාරයක් ලබා දී තිබේ. මෙම අර්බුදය සමාජයට, ආර්ථිකයට සහ රටට බලපාන ආකාරය ඔවුන් අවබෝධ

කර ගත යුතු ය. අර්බුදයේ සෑම මානයක් ම මුලින් පැහැදිලි නො වූ නමුත්, ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් පහළ ගොස් ඇති බවත්, රුපියල පීඩනයට ලක් ව ඇති බවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ පුද්ගලික අංශයේ කනස්සල්ලත්. අපට පසුව දැක ගත හැකි විය. අර්බුදයේ බලපෑම පිළිබඳ සංඥා පැහැදිලිව පෙනෙන විට ඔවුන් ප්‍රබල ලෙස අදහස් ප්‍රකාශ කර තිබීම ගැන මම සතුටු වෙමි.

*ප්‍රශ්නය: වෙනත් රටවල විරෝධතා වල දී, ජනතා ක්‍රියාකාරිත්වය ඉතා වැඩි වූ අවස්ථා දක්නට තිබේ. සාමකාමී ව අර්බුදය විසඳා ගැනීමට තරම් ශ්‍රී ලංකාව පරිණත යයි ඔබ සිතන්නේ ද?*

පළමු ව සහ ප්‍රධාන වශයෙන් දේශපාලන අර්බුදයකට මුහුණ දීමේ දී ප්‍රචණ්ඩකාරී විය යුතු නොවේ. දේශපාලන ප්‍රශ්න සම්බන්ධයෙන් ජනතා අදහස් දැක්විය යුතු ආකාරය එය නොවේ. සැබවින්ම මෙහි සිදු වෙමින් ඇත්තේ, මේ පිළිබඳ ව උනන්දු වන පුරවැසි කණ්ඩායම් විසින් ප්‍රකාශ නිකුත් කිරීම, ජනමාධ්‍ය තුළින් අදහස් පළ කිරීම, පොදු වේදිකාවල ඒ ගැන සාකච්ඡා කිරීම ආදියයි. මේවා ඉතා වැදගත් වන අතර, ඒ මගින් තෝරා පත් කර ගත් නියෝජිතයින්ට එම අදහස් සන්නිවේදනය වෙයි. නිසැකව ම එක්සත් ජනපදයේ දේශපාලන මතභේද පිළිබඳ ව අපට අත්දැකීම් තිබේ. පෙළපාළි, එවැනි විරෝධතාවල කොටසක් විය හැකිය. ඔවුන් සාමකාමී ව හා නිසි ආකාරයට තම අදහස් ප්‍රකාශයට කළ විට ජනතාවට පණිවුඩය ලැබෙන අතර විරෝධතාවේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රචණ්ඩ ප්‍රතිචාරයක දී මෙන්, රටට අලාභ හානි සිදු නොවේ. ජනයාගේ හැඟීම් වැදගත් වේ. අර්බුදය අවසන් වීමෙන් පසුවත්, ව්‍යාපාර තුළ දේශපාලන අස්ථාවරත්වය පිළිබඳ හැඟීමක් පවතිනු ඇත. කලබලකාරී තත්වයක් ඇති වූයේ නම් හානිය වඩාත් බරපතළ වනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස, අදහස් ප්‍රකාශ කිරීමට ජනතාවගේ අයිතියට අපි ගරු කරමු. මම එය දිරි ගන්වමි. එසේ නො වූයේ නම් තමන්ගේ ඡන්ද දායකයන්ගේ අදහස් දේශපාලන නායකයින් දැන ගන්නේ කෙසේ ද? නමුත් එය ප්‍රචණ්ඩත්වයෙන් තොර සිවිල් ක්‍රියාමාර්ගයක් විය යුතු ය.

*ප්‍රශ්නය: ඇතැම් දේශපාලනඥයින් සහ විශ්ලේෂකයින් පවසන්නේ වත්මන් දේශපාලන අර්බුදය නිසා ශ්‍රී ලංකාවට වෙළඳ සහ වෙනත් සම්බාධක පැනවීමට හෝ අනුග්‍රහයන් ඉවත් කිරීමට ඉඩ ඇති බවයි. ශ්‍රී ලංකාව සමඟ එක්සත් ජනපදය, පොදු වරණීය පද්ධති (GSP) වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. මේ පිළිබඳ ව ඔබේ අදහස් දැක්විය හැකි ද?*

එවැනි පියවර පිළිබඳ ව කිසිදු නිල නිවේදනයක් අප දැක නැත. හොඳ භාවිතයන්ගේ කොටසක් ලෙස *පොදු වරණීය පද්ධති* (GSP) වැඩසටහන අඛණ්ඩව සමාලෝචනය කෙරේ. දේශපාලන අර්බුදය පැහැදිලිව ම දැඩි කනස්සල්ලට හේතු වන බව මම කියමි. මා කලින් සඳහන් කළ පරිදි, නීතියේ ආධිපත්‍යය හා යහපාලනය සඳහා ගරු කිරීම මත පදනම් වූ, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනයේ ඩොලර් මිලියන 413 ක ආධාර මුදල් ලබා දීම දැනට නවතා දමා ඇත. සාකච්ඡා නැවත

ආරම්භ කර එම වැඩසටහන ඉදිරියට ගෙන යාමට පෙර, අපි මෙම අර්බුදය විසඳෙන ආකාරය බලා සිටිමු. එබැවින් අපගේ ද්විපාර්ශ්වීය කටයුතු කෙරෙහි අර්බුදය නිසැක ව ම බලපෑමක් කර තිබේ. අපි බලාපොරොත්තු වන්නේ මෙය ඉක්මනින් යථා තත්වයට පත් කළ හැකි කෙටි කාලීන ප්‍රශ්නයක් වනු ඇතැයි යන්න යි. මෙම ගිවිසුම් නිවැරදි තත්ත්වයන් හා අපේක්ෂාවන් යටතේ අප විසින් සිදු කරන බවට සහතික වීම සඳහා අප කටයුතු කළ යුතු අතර, හවුල්කරුවන් ලෙස එකිනෙකා කෙරෙහි පූර්ණ විශ්වාසයක් ඇති බවට ද සහතික විය යුතු ය. රටේ දේශපාලන කීර්තිය යළි ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකාවට අවස්ථාව ඇති අතර, ඉදිරියට යෑම සඳහා එය ඉතා වැදගත් වේ. අභියෝගාත්මක දේශපාලනයට එම කීර්ති නාමය විනාශ කළ හැකිය.

අවශ්‍ය වන්නේ රටේ ප්‍රබල හා විශිෂ්ට ලක්ෂණ තුළින් එය ඉදිරියට ගෙන ගිය හැකි ආර්ථික නායකත්වයකි. .... ඉතා වැදගත් ඉදිරි පියවරක් වන ජාතියේ දේශපාලන කීර්තිය යළි ඇති කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇති අතර, දැන් ඒ සඳහා අවස්ථාවක් ද ලැබී තිබේ. අභියෝගාත්මක දේශපාලනයට එම කීර්ති නාමය බිඳ දැමිය හැක.

*ප්‍රශ්නය: එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත් වන බවටත්, මැතිවරණ ප්‍රතිඵලවලට බලපෑම් කර ඇති බවත්, චෝදනා එල්ල වී තිබේ. වත්මන් අර්බුදය තුළ මැතිවරණ පැවැත්වීම වැළැක්වීමට කටයුතු කර ඇතැයි කියනු ලැබේ. මේ ගැන ඔබේ අදහස් දැක්විය හැකිද?*

අපේ හවුල්කරුවෙක් හා මිත්‍රයෙක් වන ශ්‍රී ලංකාව පිළිබඳ අපේ අපේක්ෂාවන් හා අභිලාෂයන් ගැන විවෘතව කථා කිරීම මැදිහත් වීමක් යයි මම විශ්වාස නො කරමි. අපේ දීර්ඝ කාලීන සබඳතා මෙන් ම අප අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන බොහෝ කරුණු ඇති බැවින් නිසැකවම ශ්‍රී ලංකාවේ නායකයින්ට අපගේ අදහස් සහ බලාපොරොත්තු ගැන සැලකිලිමත් විය හැකිය. එය කිසි සේත් රටක් හැටියට ශ්‍රී ලංකාවේ ස්වෛරී ක්‍රියාකාරිත්වයට බාධාවක් නොවේ. අප මෙහි දී සිදු කරන සියලු ම කටයුතු රජය සමඟ සහයෝගයෙන් සිදු කරන අතර එහි අරමුණ වන්නේ අපේ සංවර්ධන ව්‍යාපෘති ඉදිරියට ගෙන යෑමයි.

කෙසේ වෙතත්, විශේෂයෙන්ම මැතිවරණ සම්බන්ධයෙන්, මැතිවරණ කොමිසමේ තාක්ෂණික ධාරිතාව ගොඩ නැංවීම සඳහා ආයතනික සහාය ශක්තිමත් කර තිබේ. මෙය එක් දේශපාලන පක්ෂයක් හෝ පුද්ගලයෙකුට වැඩි වාසියක් ලබා දීමක් නොව පද්ධති ශක්තිමත් කිරීම හා අවශ්‍ය සහාය සැපයීමක් වේ. ඡන්දදායකයින්ගේ මත වෙනස් කිරීමක් නොවේ. එපමණක් නොව, කිසිවකු මැතිවරණයක් පැවැත්වීම වැළැක්වීමට අපි කටයුතු නො කරමු. මෙම අර්බුදය විසඳා ගත හැක්කේ මැතිවරණයකින් නම් අපි එම ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලියට සහාය දෙන අතර එයට ගරු කරමු. එබැවින් අපි කිසිවකු, කිසිවක් කිරීමෙන් වළක්වන්නේ නැත. කෙසේ වෙතත්, දේශපාලන නායකත්වයෙන් සහ ජනාධිපති සිරිසේන මහතාගෙන් අප ඉල්ලා සිටින්නේ රටේ ව්‍යවස්ථාවට අනුකූල නීත්‍යානුකූල රජයක් ඇති බව පැහැදිලි

වන ආකාරයට වගකීමෙන් යුතු ව මෙම අර්බුදය විසඳන ලෙසත්, රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවලට පූර්ණ ලෙස ගරු කරන ලෙසත් ය.

*ප්‍රශ්නය: එක්සත් ජනපදය ඇතුළු විශාල ආර්ථිකයන් ශ්‍රී ලංකාව ඉතා කුඩා වෙළඳපොළක් ලෙස සලකන බව පෙනේ. එයට අමතරව, බටහිරට වඩා වර්ධනය සිදු වන්නේත්, සම්පත් ගොඩ නැගෙන්නේත් නැගෙනහිර බව පෙනේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයන්, නැගෙනහිර දෙසට යොමු වන අතර එය කලාපීය දැවැන්තයින්ගේ සමීප පරීක්ෂාවටත් උනන්දුවටත් ලක් වී තිබේ. මේ පිළිබඳ ඔබේ අදහස කුමක් ද?*

පිළිතුර: ශ්‍රී ලංකාවේ සංසන්දනාත්මක වාසි සහගත තත්වය ගැන යථාර්ථවාදී වෙමින් එය උපරිමයෙන් උපයෝගී කර ගන්නා ක්‍රමෝපායකින් ඉදිරියට යෑම හොඳ ම ආර්ථික පිළිවෙතයි. ඔව්, ශ්‍රී ලංකාව කුඩා ප්‍රමාණයේ වෙළඳපොළකි. වැඩි වැඩියෙන් අන්තර් කලාපීය වෙළඳාමේ යෙදීමේ වැදගත්කම මම අවධාරණය කළ අතර, මෙසේ වෙළඳාම් කළ හැකි භාණ්ඩ හා සේවා ශ්‍රී ලංකාවේ තිබේ. එපමණක් නොව සමුද්‍රීය සම්බන්ධතා පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ද මේ රටට තිබේ. එබැවින් වෙළඳපොළට භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා ඇති එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට, එය මිනිසුන් බිලියනයක් සිටින රටක් විය යුතු නැත. අවශ්‍ය වන්නේ රටේ ඇති ප්‍රබල ලක්ෂණ ඉදිරියට ගෙන යා හැකි වඩාත් ඉලක්ක ගත ආර්ථික නායකත්වයකි. එසේම, සාම්ප්‍රදායික කර්මාන්ත වල පමණක් නොව, සංචාරක කර්මාන්තය, තොරතුරු තාක්ෂණික හා සංවිධානාත්මක සේවා සැපයීම් (logistics) වැනි අංශවල ද ආයෝජන අවස්ථාවන් තිබේ. එය එක පැත්තකින් හෝ වෙනත් පැත්තකින් උපදෙස් ගැනීමක් නොවේ. අපට ගෝලීය වශයෙන් ඒකාබද්ධ ආර්ථිකයක් ඇති අතර, ශ්‍රී ලංකාව එහි කොටසක් වේ. එක්සත් ජනපදය සහ අනෙකුත් රටවල් ද එහි කොටස් වේ. සෑම තැනකම ආයෝජන අවස්ථා ඇති බවත් ඒ සඳහා අන්තර්ජාතික උපදෙස් ලබා ගත හැකි බවත් අපි පිළිගන්නෙමු. මෙහි දී වැදගත් වන්නේ විකල්ප රාශියක් අතරෙන් හොඳ ම අවස්ථාව තෝරා ගැනීම සඳහා ආර්ථික කරුණු දෙස බැලීමයි. වඩා වැදගත් වන්නේ සෑම දෙනා ම සමාන ලෙස සලකන බව සහතික කිරීමට කටයුතු කිරීම බව මම සිතමි. සාධාරණ හා අන්‍යෝන්‍ය වෙළඳ ගිවිසුම් හා නිදහස් මුහුදු මාර්ග ආදිය ගැන අපි කථා කරමු. අපේ වාණිජ ජීවන මාර්ග වැටී ඇත්තේ මෙම පදනම මතයි. එහෙයින් මෙම අදහස් සංකල්ප පමණක් නොවන බවත් සෞභාග්‍යය කරා යන ගමනේ දී අප මෙම නීතිවලට ගරු කරන බවත් සහතික කිරීමට සියලු ස්වෛරී රටවල් එක්ව කටයුතු කිරීම අවශ්‍ය වේ.

*ප්‍රශ්නය: චීන ආයෝජනවල ශීඝ්‍ර වර්ධනය සමග ඉන්දියානු උප-මහාද්වීපයේ භූ-දේශපාලනික කටයුතු පිළිබඳ ඔබේ අදහස කුමක් ද?*

පිළිතුර: භූගෝලීය පිහිටීම අනුව ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ බොහෝ රටවල ඊර්ෂියාවට භාජනය විය හැකි ඉතා ම වැදගත් මුහුදු මං තීරු සහ සංක්‍රාන්ති මාර්ග මැදයි. මෙම කලාපය තුළත් ඉන් ඔබ්බටත් මෙම මුහුදු ගමන් මාර්ග හා අහස නිදහස්

ගමනාගමනය සඳහා විවෘතව පවතින බව සහතික කරමින් අප උනන්දු වන කරුණු බෙදා හදා ගන්නා හවුල්කරුවෙක් ලෙස එක්සත් ජනපදය, ශ්‍රී ලංකාව පිළිගනී. එහෙයින් නිදහස් ගමන් මාර්ග අවශ්‍ය අනිකුත් ජාතීන් මෙන් අපටත් මේ පිළිබඳ ව අන්‍යොන්‍ය උනන්දුවක් තිබේ. වඩාත් පුළුල් ලෙස බලන විට, චීනය හා ඉන්දියාව සමග එක්සත් ජනපදයට ප්‍රබල සබඳතා තිබේ. අප සැම විටම එකඟ නොවන නමුත්, කලාපීය අවස්ථා බොහෝමයක දී අප එක්ව කටයුතු කරන අතර ශ්‍රී ලංකාවට ද තම ප්‍රධාන හවුල්කරුවන් සමග සම්බන්ධතා පවත්වා ගෙන යෑමට හැකි වනු ඇතැයි මම අපේක්ෂා කරමි. වගකිව යුතු ආයෝජනයන් ඉදිරියට සිදු වන බවටත් ඒ මගින් තිරසාර ආර්ථික ප්‍රතිඵල ලැබෙන බවත්, ඒවායින් නියම ඉපයුම් අනුපාතිකයන් ලැබෙන බවටත්, රටේ ආර්ථික අනාගතය පිළිබඳ විකල්ප තෝරා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇති බවත් දැක ගැනීමට අපට අවශ්‍ය වේ. වර්තමාන දේශපාලන අර්බුදය විශේෂයෙන්ම දීර්ඝ කාලයක් පැවතුණ හොත් එහි ඉතා ම හානිකර ප්‍රතිවිපාකයක් වන්නේ, ශ්‍රී ලංකාවට ණය ගෙවීම සඳහා අරමුදල් ලබා ගැනීමේ සිට, අවදානම් සහගත පරිසරයකට පැමිණීමට ආයෝජකයන් මැලි වීම හා ශ්‍රී ලංකාවේ බොහෝ මිතුරන් සමඟ හවුල්කාරීත්ව අවස්ථා බිහි වීම දක්වා වූ සියලු කටයුතු තව තවත් පටු වීමයි. මෙම විකල්ප මාලාව හැකිළීමට ඉඩ ඇති අතර මේ නිසා අවශ්‍ය ඉලක්කය කරා යෑමට ශ්‍රී ලංකාවට තිබිය යුතු තෝරා ගැනීම් නැති වීමට ඉඩ ඇතැයි යන්න මගේ කනස්සල්ලට හේතු වේ.

*ප්‍රශ්නය: නව දේශපාලන පෙරළියක් සිදුවූ මාල දිවයිනට ද ඔබ තානාපතිවරයා වෙයි. මාල දිවයිනේ අනාගතය ඔබ දකින්නේ කෙසේ ද?*

පිළිතුර: නව මාලදිවයින් ජනාධිපති ඉබ්‍රාහිම් මොහොමඩ් සෝලිගේ පදවි ප්‍රාප්ති උත්සවයට මා සහභාගි වූ අතර, ජනතාව සතුටින් හා බලාපොරොත්තු සහගත ව සිටිනු දක්නට ලැබීම ප්‍රීතියට කරුණකි. මම ජනාධිපතිතුමා සහ විදේශ කටයුතු හා මුදල් අමාත්‍යවරුන් හමු වූයෙමි. නව මාලදිවයින් රජය ඉදිරියේ අභියෝග කීපයක් ඇති නමුත් ඒවාට මුහුණ දෙන ආකාරය පිළිබඳ ව ඔවුන්ට පැහැදිලි අදහසක් ඇති බව මම විශ්වාස කරමි. එක්සත් ජනපදය, හවුල්කරුවෙක් ලෙස කටයුතු කිරීමට කැමැත්තෙන් සිටින අතර එම අභියෝගාත්මක ගැටළුවලට විසඳුම් සෙවීමට මාර්ග සොයා ගැනීම සඳහා සහය දීමට සූදානම් ය. ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරීම සහ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා වූ ජනාධිපති සෝලීගේ කැපවීම ඉතා අව්‍යාජ වේ. සංචාරක ව්‍යාපාරය මත යැපෙන රටක් වන මාලදිවයිනේ, නව පරිපාලනයට ජාතියේ දේශපාලන කීර්තිය යළි ඇති කිරීමට අවස්ථාව උදා වී තිබේ.

*ප්‍රශ්නය: කලාපීය වෙළඳාම වැඩි කිරීම ගැන ඔබ සඳහන් කළා. දකුණු ආසියාවේ වරණීය වෙළෙඳ සැලැස්මක් තිබුනත් දේශපාලන මතභේද ආදිය නිසා එහි ප්‍රගතියක් නැත. ඔබ එම අදහසට එකඟ ද?*

පිළිතුර: මෙම කලාපයේ මගේ පූර්ව අත්දැකීම් අනුව, එයට හේතුව ගැටලු ගණනාවක් යැයි මම සිතමි. මෙයින් එකක් වන්නේ රටවල් අතර සහ රටවල් තුළ භෞතික

සබඳතා හා යටිතල පහසුකම් වල දුර්වලතාවන්ය. තවත් කරුණක් වන්නේ කලාපීය බලශක්ති යටිතල පහසුකම් ය. වර්ධනය වන ආර්ථිකයක් සඳහා ඒකාබද්ධ ජාලයක් සහිත බලශක්ති සැපයුමක් අවශ්‍ය වේ. තවත් සැලකිය යුතු කරුණක් වන්නේ තීරු බදු නොවන බාධකයක් ය. මෙම ගැටලු සම්බන්ධයෙන් ආණ්ඩු කැපවීමෙන් යුතු ව ක්‍රියා කළ යුතු ය. මෙහි වාසි ගෙන දෙන තත්වයක් ඇති අතර එය එක් මං වීදියක් යැයි මම නො සිතමි.

*ප්‍රශ්නය: එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ආරක්ෂණවාදය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන පුද්ගලයෙක් ලෙස පෙනේ. මෙය ඒ හා සමාන ස්ථාවරයක් ගැනීමට වෙනත් ජාතීන්ට බලපෑම් ඇති කර තිබේ. දකුණු ආසියාවේ අන්තර් කලාපීය වෙළඳාම වැඩි කිරීමට නිර්දේශ කිරීමේ සන්දර්භය තුළ ට්‍රම්ප් පරිපාලනය විසින් හඳුන්වා දුන් සමහර වෙළඳ පියවර ඔබ සාධාරණීකරණය කරන්නේ කෙසේ ද?*

ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සාධාරණ හා අන්‍යෝන්‍ය වෙළඳාම සම්බන්ධයෙන් පැහැදිලි ලෙස පෙනී සිටි. ද්විපාර්ශ්වික වෙළඳ කටයුතු වල වැදගත්කමත්, එම සබඳතාවල අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහතික කිරීමත් සඳහා ඔහු පෙනී සිටී. එය කුමන රටක් විසින් වත් සලකා බැලීමට නුසුදුසු උපදෙසක් යයි මා නො සිතමි. අවසාන වශයෙන් එක්සත් ජනපදය උනන්දු වන්නේ කලාපීය හා ගෝලීය වෙළඳාම සම්බන්ධයෙන් නීති මත පදනම් වූ ක්‍රියා පිළිවෙළකි. එවිට අපට නීති අනුව කටයුතු කරමින් එකිනෙකාට ගෞරවයෙන් සලකමින් සෑම පාර්ශවයකට ම වාසි සැලසෙන බව සහතික කළ හැකියි. එක්සත් ජනපදයේ විදේශ ආයෝජනයන් වර්ධනය කිරීම මෙන් ම වෙනත් තැන්වල ආයෝජනයන් සහතික කිරීම සඳහා අපි නියත වශයෙන් ම උනන්දු වෙන අතර වෙනත් රටවල් ද එවැනි ආකාරයේ ආයෝජනයක් සඳහා විවෘතව සිටින බවටත්, එම ආකාරයේ ආයෝජන සඳහා ඔවුන්ගේ ආර්ථිකයන් විවෘතව ඇති බවටත් සහතික වනු ඇතැයි අපේක්ෂා කරමු. සෞභාග්‍යය කරා යන මාර්ගය වන්නේ එයයි.

*ප්‍රශ්නය: රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වශයෙන් ඔබ කරන්නේ කුමක් ද?*

ධනාත්මක අවස්ථාවන් සොයා යෑමයි. අපේ රටවලට සහ ජනතාවන්ට විශාල වශයෙන් අවස්ථාවන් තිබේ. අන්‍යෝන්‍ය ගෞරවය මත පදනම් වූ සබඳතා, පොදු සාරධර්ම මාලාවක් සහ අදහස් ඇති විට, මම එය දකින්නේ හවුල් වීමට හා එක්ව වැඩ කිරීමට අවස්ථාවන් ලෙසයි. මගේ රැකියාවෙන් අඩක් වන්නේ රාජ්‍ය-රාජ්‍ය සම්බන්ධතා කළමනාකරණය කිරීමයි. අනිත් අඩ වන්නේ ජනතාවන් අතර මිත්‍ර සබඳතා ගොඩ නගමින් ඇමරිකානු ආයතන සහ ව්‍යාපාර සඳහා ශ්‍රී ලංකාවෙන් සුදුසු හවුල්කරුවන් සොයා ගැනීම යි. මේ රටවල් එකට බැඳ තබන්නේ මේවා වන අතර, ඒ මගින් අප සියලු දෙනා ම අපේක්ෂා කරන, සමෘද්ධිමත් සහ ස්ථාවරත්වයකින් පිරී අනාගතයක් ගොඩ නැගිය හැකි වනු ඇත. ඒ නිසා මගේ විශ්වාසය වන්නේ කිසිදු අවස්ථාවක් සාකච්ඡා නො කර අත්හැරිය යුතු නැති බවයි. අපේ අවධානයට ලක් විය

යුතු බොහෝ දේ ඇති බැවින් අප කළ යුතු දේ තෝරා ගත යුත්තේ ප්‍රමුඛතා පදනමක් මතයි.

*ප්‍රශ්නය: ඔබේ නිල කාලය අවසානයේ ඔබ සතුටට පත් වන්නේ කුමකින් ද?*

හොදම ප්‍රතිඵලය වන්නේ සංඛ්‍යා ඉහළ යෑමයි: ඒ අතර ආයෝජනය හා වෙළදාම වැඩි වීමත් අපගේ සබඳතා ගැඹුරු වීමත් වේ. මා සතුටට පත් කරන තවත් බොහෝ තක්සේරු කළ නො හැකි දේ තිබේ. සංහිදියාව හා වගකීම පිළිබඳ කැපවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට සහාය වීමට එක්සත් ජනපදයට හැකි වූ බව දැන ගැනීමත්, නීතියේ ආධිපත්‍යය පිළිබඳ කටයුතු කරන ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීම සඳහා එකට වැඩ කළ බවත් දැන ගැනීම මගේ සතුටට හේතු වනු ඇත. සමහර අවස්ථාවල දී මෙය සිදු කරනු ලබන්නේ ජනතාව හුවමාරු කර ගැනීමෙනි. එක්සත් ජනපදයේ විශේෂඥයන් ශ්‍රී ලංකාවට පැමිණීමත්, එක්සත් ජනපදයේ අදාළ කටයුතු සිදු කරන ආකාරය බැලීමට ශ්‍රී ලංකා බලධාරීන්ට ආරාධනා කිරීමත් මේ සඳහා  යොදා ගනී. සමහර අවස්ථාවල දී, නූතන රටක ගැටලුවලට පහසු පිළිතුරු නැත. එබැවින් බොහෝ විට දෙපාර්ශවයට ම ඉගෙන ගත හැකි හොඳ ම මාර්ගය වන්නේ දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම විය හැකිය. සාම හමුදා වැඩසටහන හොඳින් ක්‍රියාත්මක වනු දැක බලා ගැනීමට මා කැමතියි. ඔවුන්ගේ නායකත්වය තෝරා ගෙන ඉදිරියට යා හැකි ලෙස ශ්‍රී ලංකාවේ  ජනතාව පූර්ණ ලෙස බලවත් කරන මැතිවරණයක් පවත්වනු දැකීමට ද මම කැමැත්තෙමි.